**මීනුවන්ගොඩ නගර සභාව - 2021**
**------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**
**-------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**
**---------------------------**

මීනුවන්ගොඩ නගර සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 181 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට මීනුවන්ගොඩ නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**
**-------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**
**---------------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

නගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශකිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව්කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, නගර සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(I)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(I)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති**

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| ගිණුම්කරණ ප්‍රතිපත්ති අංක 3.2 යටතේ පරිගණක මෘදුකාංග, වත්කම් ලෙස මූල්‍ය ප්‍රකාශන තුළ හඳුනා ගන්නා බව දන්වා තිබුණද ආදායම් අංශයේ හා පුස්තකාලයේ භාවිතා කරන පරිගණක මෘදුකාංග දෙකක වටිනාකම ගණනය කර ගිණුම්ගත කර නොතිබුණි. | 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් කිරීමට කටයුතු කරන බව දන්වමි. | අනාවරණය කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති අනුව කටයුතු කළ යුතුවේ. |

**1.6.2 ගිණුම්කරණ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) පොදු වෙළඳපල අසල කාණු පද්ධතිය සකස් කිරීම වෙනුවෙන් රු.317,713 ක් කෙරීගෙන යන වැඩ ලෙස ගොඩනැගිලි යටතේ සහ මාර්ග යටතේ දෙවරක් ගිණුම්ගත කිරීම හේතුවෙන් ජංගම නොවන වත්කම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.<br><br>(ආ) ඉකුත් වර්ෂයේ වැඩ අවසන් කර තිබූ මාර්ග 05 ක රැඳවුම් මුදල් රු.488,433 ක් සමාලෝචිත වර්ෂයේ අවසානයට කෙරීගෙන යන වැඩ ලෙස ගිණුම්ගත කර තිබීමෙන් සමාලෝචිත වර්ෂය සඳහා ක්ෂය රු.48,843 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | 2022 වර්ෂයේ අවසන් ගිණුම මගින් නිවැරදි කරන බව දන්වමි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | වටිනාකම රු.189,000 ක් වටිනා ට්‍රැක්ටර් ටේලරයක්, මෝටර් වාහන යටතේ ගිණුම්ගත කර තිබියදී පොදු ගබඩා ගිණුමටද ඇතුළත් කර තිබීමෙන් ගබඩා තොග ගිණුම එම ප්‍රමාණයෙන් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | | |
| (ඇ) | 2017 වර්ෂයේ රු.5,388,056 ක් වැය කර ඉදිකර තිබූ හදිරම හන්දිය වැසිකිළි පද්ධතිය දේපළ, පිරියත උපකරණ යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | | |
| (ඉ) | යන්ත්‍ර හා පිරියත උපකරණ ක්ෂය රු.27,513 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | 2022 වර්ෂයේ අවසන් ගිණුම මගින් නිවැරදි කරන බව දන්වමි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. |
| (ඊ) | වත්කම් ඉවත් කරන වර්ෂය සඳහා සම්පූර්ණ වර්ෂය සඳහාම ක්ෂය කිරීම සභාවේ ක්ෂය ප්‍රතිපත්තිය වූවද සමාලෝචිත වර්ෂයේ ඉවත් කර තිබුණු රු.372,267 ක් වූ ටේලර් 02 සඳහා සමාලෝචිත වර්ෂයට අදාල ක්ෂය රු.14,891 ක් ගිණුම්ගත කර නොතිබුණි. | | |
| (උ) | ජර්නල් සටහන් මඟින්, වැරදි නිවැරදි කිරීමක් ලෙස රු300,630 ක් ලී බඩු ගිණුම හර කර තිබුණද එය ඉකුත් වර්ෂයේ මිලදී ගෙන ගිණුම්ගත කර තිබුණ යන්ත්‍ර හා උපකරණ වටිනාකමක් වූයෙන් ලි බඩු ගිණුමේ ශේෂය රු.300,630 ක් ද ලී බඩු ක්ෂය ගිණුමේ ශේෂය රු.22,547 ක් ද වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | | |
| (ඌ) | දේශීය ණය සංවර්ධන අරමුදලට ගෙවිය යුතු ණය ශේෂය රු.82,274 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | | |
| (එ) | මුදල් ප්‍රවාහ ප්‍රකාශයක මෙහෙයුම් ආයෝජන හා මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනනය වන ශුද්ධ මුදල් ප්‍රවාහයන්ගේ එකතුව වර්ෂය තුළ මුදල් සහ මුදල් හා සමාන දැවල ශුද්ධ වැඩි වීමට/අඩුවීමට සමාන විය යුතු වූවද පිළියෙල කර තිබූ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම්, ආයෝජන හා මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනනය වන ශුද්ධ මුදල් ප්‍රවාහයන්ගේ එකතුව රු.165,322,846 ක් ලෙසද මුදල් | 2022 වර්ෂයේ අවසන් ගිණුම මගින් නිවැරදි කරන බව දන්වමි. | නිවැරදිව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කළයුතු වේ. |

සහ මුදල් හා සමාන දෑවල ශුද්ධ වැඩි වීම රු.9,448,096 ක් වී තිබුණෙන් රු.155,874,750 ක වෙනසක් වී තිබුණි.

### 1.6.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ලී බඩු ගිණුමේ ශේෂය රු.6,684,449 ක්ද උපයෝගී ලේඛන අනුව ශේෂය රු. 6,364,582 ක් ද වූයෙන් එම ශේෂයන් අතර රු. 440,837 ක වෙනසක් නිරීක්ෂණය විය. | 2022 වර්ෂයේ අවසන් ගිණුම මගින් නිවැරදි කරන බව දන්වමි. | අදාල ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ අතිරික්තය රු.22,083,743 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.5,039,859 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු හිඟ වරිපනම් වටිනාකමින් රු.50,000 ඉක්මවා තිබූ වරිපනම් ඒකක 47 ක් වෙනුවෙන් අයවිය යුතු හිඟ වරිපනම් වටිනාකම රු.3,950,735 ක් වී තිබුණි. | පිළිතුරු ලබා දී නැත. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. |

### 2.2.2 කුලී

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 වර්ෂය සඳහා නව සතිපොළ බදු දීමේදී වූ ගිවිසුමේ 3 වගන්තිය ප්‍රකාරව දින 04 කට සමාන මුදල වූ රු.885,000 ක් සභාවේ තැන්පත් කර තිබුණද, ඉතිරි වටිනාකමට සමාන දේපල ඇපයක්/ බැංකු ඇපකරයක්/ රක්ෂණ ආවරණයක් සභාවට | හිඟ මුදල් ඇපතැන්පත් මුදලින් අඩුකර ටෙන්ඩර්කරුගේ නම අසාදු ලේඛණගත කිරීමටත් ඉදිරි කාලය සඳහා නගර සභාව | ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |

| | | |
|---|---|---|
| ලබාදීමට දෙවන පාර්ශවය එකඟ වන්නේය යන්න සඳහන් වුවද, එසේ ඇපකරයක් ලබාදීමට කටයුතු කර නොතිබුණි. කොරෝනා වසංගත තත්ත්වය මත 2021 ජනවාරි 31 හා 2021 පෙබරවාරි 07 යන දින 02 සඳහා බදු සහන ලබා නොදිය යුතු බව 2021 මාර්තු 09 දින සභා තීරණය මඟින් දක්වා තිබුණි. ඒ අනුව බදුකරු විසින් සතිපොළ කටයුතු පවත්වාගෙන යාමට නොහැකි බව දක්වා ටෙන්ඩරය අවලංගු කරන ලෙස ඉල්ලා තිබුණි. ඒ අනුව එම දින 02 සඳහා ආරක්ෂිත ඇප මුදලින් මුළු මුදල රු. 442,500 ක් අඩු කර ආපසු ගෙවීමට කටයුතු නොකොට රු.221,250 ක් පමණක් අඩු කර රු.663,750 ක් ලංසුකරුට ගෙවා තිබුණි. | මඟින් සතිපොළ ගාස්තු අය කිරීමටත් කමිටුව තීරණය කර ඇති බව දන්වමි. | |

## 3. මෙහෙයුම් සමාලෝචනය

නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

## 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 වර්ෂයේදී රු.5,388,056 ක් ගෙවීම් කරමින් හදිරම හන්දියේ ඉදිකරන ලද වැසිකිළි පද්ධතිය 2021 දෙසැම්බර් 31 දින වන විටත් අවුරුදු 04 කට ආසන්න කාලයක් මහජන පරිහරණය සඳහා විවෘත කිරීමකින් තොරව තිබියදී සංචාරක ආකර්ශණීය වෙළඳ මධ්‍යස්ථානයක් හා නවාතැන් පහසුකම් සහිත විවේක ස්ථානයක් ස්ථාපිත කිරිමේ ව්‍යාපෘතිය සඳහා ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලබා ගෙන මෙම වැසිකිළි පද්ධතිය ඉවත් කිරීමට 2021 මාර්තු 09 දින මහා සභාවේදී යෝජනා කර තිබුණි. ඒ හේතුවෙන් එය ඉදි කිරීම සඳහා වැය කළ මුදල කළමනාකරණයේ පැවති තීරණ ගැනීමේ දූර්වලතාවය නිසා සිදුවූ නිශ්කාර්ය වියදමක් වශයෙන් නිරීක්ෂණය වේ. | වැසිකිළි පද්ධතිය ඉවත් කිරීමට ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලබාගැනීමට ඉල්ලුම් කර ඇති අතර මෙතෙක් අනුමැතියක් හෝ නිර්දේශයක් සභාව වෙත ලබාදී නොමැත. නැවත වරක් මේ සම්බන්ධව ආණ්ඩුකාරවරයා වෙත ලිපියක් යොමු කර ඇති බව දන්වමි. | ඉදිකිරීම් නගර සංවර්ධන සැලැස්මට අනුව සිදු කළයුතුයි. |

## 3.2 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මීනුවන්ගොඩ කොළඹ පාරේ අඹගහවත්ත ඉඩමේ තෙමහල් ගොඩනැගිල්ලක් ඉදි කිරීමට සමිතියක් සමඟ ගිවිසුම්ගතවී තිබුණද මේ සඳහා ශක්‍යතා අධ්‍යනයක් සිදුකර නොතිබූ අතර ව්‍යාපෘති වාර්තාවක් හා මුළු පිරිවැය ඇස්තමේන්තුවක්ද අනුමත කර නොතිබුණි. මෙම ව්‍යාපෘතියේ I අදියරවූ තෙමහල් ගොඩනැගිල්ලේ අත්තිවාරම දැමීම සඳහා ගිවිසුම්ගත මුදල රු.2,355,303 ක් වූ අතර ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.9.4 වගන්තියට පටහැනිව සමිතියක් තෝරා ගෙන ටෙන්ඩරය ප්‍රදානය කර තිබුණි. මුලු පිරිවැය අනුව මෙම ඉදිකිරීමට අදාළව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.5 වගන්තිය අනුව ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියෙහි කොන්ත්‍රාත් කොන්දේසි හා පිරිවිතර අනුව ගිවිසුම්ගත විය යුතු වුවද එසේ කටයුතු කර නොතිබූ අතර ඉදි කිරීම් කටයුතු 2019 වර්ෂයේදී ආරම්භ කළද සභාවට අයත් එම ඉඩමේ ආරක්ෂාව පිළිබඳව සභාව කටයුතු නොකිරිම හේතුවෙන් ඉදිකිරීම් කටයුතු අධිකරණ වාරණ නියෝගයක් මත අතරමග නැවතීම සිදුවී තිබුණි. | සැලසුම් කමිටුව මගින්ද සැලසුම සඳහා තහවුරු කර අනුමැතිය ලබාදී ඇත.වෙනත් පාර්ශවයක් මගින් තහනම් නියෝගයක් ලබාගැනීම සිදුව ඇති අතර, පවතින නීතිමය තත්ත්වය මත ඉදිකිරීම් අත්හිටුවීමට සිදුවූ බව දන්වමි. | මුළු පිරිවැය ඇස්තමේන්තුවක් මත ප්‍රසම්පාදන කටයුතු සිදුකර ගැටළු නිරාකරණය කරගෙන ව්‍යාපෘති ආරම්භ කිරීම කළ යුතුවේ. |
| (ආ) | 2012 වර්ෂයේදී සතිපොළ ඉදිකිරිම් සඳහා වියදම් කළ රු.10,118,651 ක මුදල, කිසිදු වත්කමක් සභාවට උත්පාදනය නොකර නිශ්කාර්ය වියදමක් බවට පත්ව තිබූ අතර ඵලදායි ව්‍යාපෘති පිළිබඳව නිවැරදි අධ්‍යනයක් සිදුකර ව්‍යාපෘති හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි. | විවෘත ගොඩනැගිල්ල ඉවත් කිරීමට ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලැබී ඇති අතර ගොඩනැගිල්ලේ ඉවත් කරනු ලබන කොටස් වලින් කොටසක් සභාවේ වාහන අංගනයේ වහලය සකස් කිරීමට කටයුතු කර ඇත. ඉතිරි කොටස ආරක්ෂිතව සතිපොළ පරිශ්‍රයේ තැන්පත් කර ඇති බව දන්වමි. | ව්‍යාපෘති සැලසුම් කිරීම නගර සංවර්ධන සැලැස්මට අනුව සිදුකළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | මිනුවන්ගොඩ පරණ බස් නැවතුම්පල අසල යෝජිත මාර්ගය කොන්ක්‍රීට් කිරීමේ කර්මාන්තය 2021 සැප්තැම්බර් 16 දින මාස 3 කින් නිම කිරීම සඳහා රු 1,618,136 ක මුදලකට ප්‍රජා මණ්ඩලයක් සමග ගිවිසුම්ගතව තිබූ අතර 2022 ජනවාරි 11 දින සියයට 10 ක රඳවුම් අඩුකොට රු.1,093,607 ක් කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණි. මාර්ගය ඉදිකිරීම් ගැටළු පරීක්ෂාව තිදෙනෙකුගෙන් යුතු පරීක්ෂණ මණ්ඩලයක් පත්කර තිබුණු අතර ඔවුන්ගේ වාර්තාව අනුව A B C යෙදීම සඳහා වූ උස අඩි 1 කට මුළු මාර්ගයට අවශ්‍ය වන මුළු කියුබ් ප්‍රමාණය කියුබ් 50.5 ක් ලෙස ඇස්තමේන්තු කර තිබුණද කමිටු වාර්තාව අනුව යොදා තිබුණේ උස අඟල් 4 ක් හා කියුබ් 25.0 ක් වූයෙන් මෙම මාර්ගය නියමිත ප්‍රමිතියට සිදුකර නොමැති බව නිරීක්ෂණය විය. 2022 අප්‍රේල් 04 දින සභා ලේකම්ගේ වාර්තාවට අනුව කොන්ක්‍රීට් කළ ස්ථානයේ මතුපිට ස්ථාන කිහිපයක් පලුදුවී ඇති බවත් එහි අළුත්වැඩියාවන් සිදු කරන ලෙසත් දන්වා තිබුණද 2022 අප්‍රේල් 15 දින වන විටත් එම අළුත්වැඩියාවන් සිදුකර නොතිබුණි. | තාක්ෂණ නිළධාරී විසින් වාර්තා කර ඇත්තේ පිළිගත් රජයේ ආයතනයක් මගින් ABC තට්ටුවේ ඝනකම, කොන්ක්‍රීට් තට්ටුවේ ඝණකම හා කොන්ක්‍රීට් තට්ටුවෙහි සම්පිණ්ඩන ශක්තිය පරීක්ෂා කිරීමේ පරීක්ෂණ සිදුකිරීම සුදුසු බවය. එම වාර්තාවේ වාර්තා කර ඇති ආකාරයට ගෙවීම් කිරීමට මහ සභාවේ අනුමත කර ඇත. මාර්ගයේ පළුදු වීම් නිරීක්ෂණය වන බැවින් ඒවා අළුත්වැඩියා කිරිමට කොන්ත්‍රාත්කරුට දැනුම් දී ඇති අතර අළුත්වැඩියා කිරීම් මෙතෙක් සිදුව නොමැති බැවින් අළුත්වැඩියාවෙන් අනතුරුව මාර්ගයේ තත්ත්වය පිළිබඳ නැවත වාර්තා කළ හැකි බව දන්වමි. | ඉදිකිරීම් ව්‍යාපෘති කිරීමේදී තත්ත්ව පාලනය සහතික කරගැනීම සඳහා පාලන ක්‍රම ස්ථාපිත කළයුතුය. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

### සේවක පුරප්පාඩු හා අතිරික්ත

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආදායම් පරීක්ෂකවරුන්ගේ හිඟකම නිසා කොට්ඨාශ 11 ක හිඟ ආදායම් අය කිරීම ගැටළු සහිතවී තිබුණි. | ආදායම් පරීක්ෂක තනතුරේ පුරප්පාඩු පිරවීමට අනුමැතිය ඉල්ලා ඇති නමුත් මේ දක්වා අනුමැතිය ලැබී නොමැත. | සේවක මණ්ඩලයේ පුරප්පාඩු පිරවීමට අදාල ක්‍රියාමාර්ග ගත යුතු වේ. |